# අභිලාෂ ප්‍රකාශ කිරීම (EOI)

## ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ්

# SLIBTEC
# අභ්‍යන්තර විගණක සඳහා උපදේශන සේවාව ලබා ගැනීම

**කොන්ත්‍රාත් අංකය : SLIBTEC/PROC/307/Consultancy/ Procurement of Consultation Service for Internal Auditor to SLIBTEC**

1. හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේන්වත්ත හි පිහිටි ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC), ශ්‍රී ලංකාව කලාපීය ජෛව තාක්ෂණික මධ්‍යස්ථානයක් ලෙස ස්ථාපිත කිරීමේ අරමුණින් ශ්‍රී ලංකාවේ ප්‍රථම ජෛව තාක්ෂණික නවෝත්පාදන උද්‍යානය සංවර්ධනය කරමින් සිටී. SLIBTEC ආයතනය 2020 ඔක්තෝබර් මාසයේදී භාණ්ඩාගාර ලේකම්වරයාගේ පූර්ණ කොටස් හිමිකාරීත්වය සහිත රජයට අයත් ආයතනයක් ලෙස ලියාපදිංචි කරන ලදී.

2. ජෛව තාක්ෂණ ක්ෂේත්‍රයේ පර්යේෂණ, සංවර්ධන සහ වාණිජකරණයෙහි නිරත රජයට අයත් ආයතනයක් වන ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් (SLIBTEC) විසින් අභ්‍යන්තර විගණන උපදේශන සේවා සැපයීම සඳහා සුදුසුකම් සහ පළපුරුද්ද සහිත තනි පුද්ගලයන් වෙතින් අභිලාෂ ප්‍රකාශ කිරීම් (EOI) ආරාධනා කර සිටියි.

3. මෙම කාර්යයේ අරමුණ වන්නේ SLIBTEC හි මූල්‍ය කටයුතුවල විනිවිදභාවය සහ විශ්වාසනීයත්වය තහවුරු කිරීම, අදාළ නියාමන හා නීතිමය අවශ්‍යතා සහ ශ්‍රී ලංකා රජයේ මාර්ගෝපදේශයන්ට අනුකූල වීම ඇගයීම, වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනා ගැනීම සහ ආයතනික පාලනය හා අවදානම් කළමනාකරණ පරිපාටීන් ශක්තිමත් කිරීමයි.

4. තනි පුද්ගල උපදේශකවරයා විසින් ඉටු කළ යුතු කාර්ය පරාසයට පහත සඳහන් කාර්යයන් ඇතුළත් වන නමුදු එම කාර්යයන්ට පමණක් සීමා නොවේ (සියලු ක්‍රියාපටිපාටීන් අදාළ රජයේ/පළාත් පාලන රෙගුලාසිවලට අනුකූල විය යුතුය):
   - SLIBTEC සඳහා අවදානම් පදනම් කරගත් වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කිරීම.
   - ත්‍රෛමාසික විගණන කමිටු රැස්වීම් සංවිධානය කිරීම සහ නිරීක්ෂණ, නිර්දේශ සහ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර ඇතුළත් වාර්තා ත්‍රෛමාසිකව සහ වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.
   - පිළිගත් අභ්‍යන්තර විගණන ප්‍රමිතීන්ට අනුකූලව අභ්‍යන්තර විගණනයන් පැවැත්වීම.
   - අභ්‍යන්තර පාලන, මූල්‍ය කළමනාකරණය, ප්‍රසම්පාදන, තොග පාලනය, මානව සම්පත් සහ මෙහෙයුම් ක්‍රියාවලීන්හි ප්‍රමාණවත් බව සහ සඵලතාවය මාසිකව සහ වාර්ෂිකව සමාලෝචනය කිරීම.
   - අදාළ නීති, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, මුදල් රෙගුලාසි සහ අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූල බව තහවුරු කිරීම.
   - අවදානම්, පාලන දුර්වලතා සහ අකාර්යක්ෂමතාවයන් හඳුනාගෙන ප්‍රායෝගික වැඩිදියුණු කිරීම් යෝජනා කිරීම.
   - එකඟ වූ බාහිර විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විපරම් කිරීමේ කටයුතු සිදු කිරීම.
   - ස්වාධීනත්වයට බාධාවක් නොවන පරිදි, ඉල්ලා සිටින අවස්ථාවන්හිදී කළමනාකාරීත්වය වෙත උපදේශන සේවා සැපයීම.

5. පැවරුම් කාලසීමාව

   මෙම පැවරුම වසර දෙකක කාලසීමාවක් සඳහා වන අතර, ආයතනය වෙත පැමිණීමේ වාර ගණන අවම වශයෙන් සතියකට වරක්වත් විය යුතුය (අදාළ පුද්ගලයා හෝ පහත 7(ඉ) හි සඳහන් කර ඇති අනුමත සුදුසුකම්ලත් නියෝජිතයෙකු විසින්). SLIBTEC අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණය මත, සෑහීමකට පත්විය හැකි කාර්ය සාධනය සහ ආයතනික අවශ්‍යතා මත පදනම්ව කාලසීමාව දීර්ඝ කිරීමේ හැකියාව ඇත.

6. උනන්දුවක් දක්වන තනි පුද්ගල උපදේශකයින් පහත සඳහන් අවම සුදුසුකම් සපිරිය යුතුය:
   - සහතිකලත් අභ්‍යන්තර විගණක (CIA) හෝ වරලත් ගණකාධිකාරී (ICASL හරහා CA), ACCA, CIMA හෝ ඊට සමාන වෘත්තීය සහතිකයක්.
   - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය, මූල්‍ය, විගණනය හෝ ඊට අදාළ ක්ෂේත්‍රයක උපාධියක්.
   - ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර විගණන ක්ෂේත්‍රයේ ප්‍රමුඛතාවය සහිතව අවම වශයෙන් වසර 3 කට වැඩි විගණන පළපුරුද්ද.
   - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLAS), බදු නීති, 2007 අංක 7 දරන සමාගම් පනත, කඩසාප්පු සහ කාර්යාල සේවක පනත, සහ රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ හා ශ්‍රී ලංකා මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ පිළිබඳ මනා අවබෝධයක්.
   - විගණන කළමනාකරණ මෘදුකාංග (Audit management software), දත්ත විශ්ලේෂණ මෙවලම් (Data analysis tools) සහ MS Office (Excel, Word, Outlook) පිළිබඳ ප්‍රවීණත්වය..
   - විගණන සැලසුම් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේ පළපුරුද්ද.
   - මූල්‍ය ලේඛන සහ විගණන වාර්තා සකස් කිරීම සහ සමාලෝචනය කිරීමේ ප්‍රවීණත්වය.
   - අධ්‍යක්ෂ මණ්ඩලය සමඟ සඵලදායී ලෙස කටයුතු කිරීම සඳහා ශක්තිමත් සන්නිවේදන සහ පුද්ගලාන්තර කුසලතා.
   - විශිෂ්ට විශ්ලේෂණාත්මක, ගැටලු විසඳීමේ සහ විවේචනාත්මක චින්තන කුසලතා.
   - ස්වාධීනව හෝ කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ හැකියාව.
   - විශිෂ්ට කථන සහ ලිඛිත සන්නිවේදන කුසලතා.
   - දැඩි ආචාර ධර්ම ප්‍රමිතීන් සහ රහස්‍යභාවය සුරැකීමේ කැපවීම.
   - වෙනස් වන නියාමන පරිසරයන්ට සහ කර්මාන්ත පරිපාටීන්ට අනුගත වීමේ හැකියාව.
   - ශ්‍රී ලංකා රජයේ මුදල් රෙගුලාසි, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, කම්කරු නීති සහ අනෙකුත් අදාළ නීති පිළිබඳ මනා දැනුම.

7. අභිලාෂී පුද්ගලයින් www.slibtec.gov.lk/procurement/ වෙබ් අඩවියේ දක්වා ඇති ආකෘතියට අනුව, උපදේශන සේවාව ඉටු කිරීමට තමන් සුදුසුකම් ලබා ඇති බව පෙන්වන ප්‍රමාණවත් සාක්ෂි සහිත ලේඛන ඉදිරිපත් කළ යුතුය. උපදේශන සේවාවේ යොමු අනුදේශ (TOR) සහ අනෙකුත් තොරතුරු පරිශීලනය සඳහා වෙබ් අඩවියට යොමු කර ඇත.
   - අ. අත්සන් කරන ලද අභිලාෂ ප්‍රකාශ කිරීමේ ලිපිය
   - ආ. අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පූර්ව පැවරුම් සහ සේවාලාභී ලැයිස්තුව ඇතුළත් සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාව (CV) (අමුණා ඇති 01 සහ 02 අභිලාෂ ප්‍රකාශ කිරීමේ (EOI) තොරතුරු ආකෘති පත්‍රයට අනුව)
   - ඇ. අදාළ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සාක්ෂි (සම්පූර්ණ කරන ලද සමාන පැවරුම්වල තොරතුරු සහ සම්බන්ධ කරගත හැකි විස්තර ඇතුළත්ව)
   - ඈ. ජාතික හැඳුනුම්පතේ (NIC) පිටපතක්
   - ඉ. කණ්ඩායම් සාමාජිකයින්ගේ සවිස්තරාත්මක ජීව දත්ත පත්‍රිකා (CV)
   - ඊ. වෙනත් ඕනෑම අදාළ තොරතුරක්

8. ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද උපදේශකයින් තේරී පත් කරගැනීමේ සහ සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශයන්හි දක්වෙන උපදේශක සුදුසුකම් ක්‍රමවේදයට (CQS – 2007 අගෝස්තු) අනුකූලව උපදේශකවරයෙකු තෝරා ගනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරන ලද උපදේශකයින්ට පසුව සවිස්තරාත්මක යෝජනාවලියක් ඉදිරිපත් කිරීමට ආරාධනා කරනු ලැබිය හැක.

9. අභිලාෂී පුද්ගලයින්ට වැඩිදුර තොරතුරු, හෝමාගම, පිටිපන, තලගල පාර, මාහේන්වත්ත, I වන අදියර ගොඩනැගිල්ල, ලිපිනය හි ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ් තරිඳු මධුෂංඛ මහතා (ප්‍රසම්පාදන කළමනාකාර) වෙතින් සඳුදා සිට සිකුරාදා දක්වා, පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා ලබා ගත හැක. දුරකථන : +94 11 3431844,. වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර www.slibtec.gov.lk වෙත පිවිසෙන්න.

10. ඉල්ලීම් කර ඇති සියලුම තොරතුරු ඇතුළත් අභිලාෂ ප්‍රකාශ කිරීමේ ලේඛනය, එහි දෙවන පිටපතක් ද සහිතව 2026 අගෝස්තු 10 වන දින ප.ව. 2.30 ට ප්‍රථම පහත සඳහන් ලිපිනයට භාර දිය යුතුය. අභිලාෂ ප්‍රකාශ කිරීමේ ලේඛනය අඩංගු කවරයේ "Expression of Interest – Internal Audit Consultancy Service (Individual Consultant)" ලෙස සටහන් කළ යුතුය.

**ප්‍රධාන මෙහෙයුම් නිලධාරී,**
**ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලජි ප්‍රයිවට් ලිමිටඩ්,**
**SLIBTEC අදියර 1 ගොඩනැගිල්ල,**
**මාහේන්වත්ත, තලගල පාර,**
**පිටිපන, හෝමාගම.**
**දුරකථන : +94 113 431 844**
**විද්‍යුත් තැපෑල : slibtec@gmail.com**
**වෙබ් අඩවිය : www.slibtec.gov.lk**

**2026 ජූලි 27**